# ජ්‍යෝතිෂය විෂයක්ෂේත්‍රය හා සැබැඳි නූතන පර්යේෂණ

කුඩාවැවේ සෝමානන්ද හිමි

The purpose of this research is to show the modern tendencies of the "Astrology". Astrological yoga (connections) and movements of planets, wave lengths, intensifications and changes of frequencies have different liveliness of senses of people. They have an impact on the lives of people. Accordingly, through the researches carried out by scientists about the atmospheric rays and also the impact of the Sun, it is accepted the foundation principle of the astrology. The Russian biologist and physicist Professor Georges Lakovuski who became specialized in the area can be quoted as an example. He points out that the waves released by planets can affect a person at the time of his rebirth and can influence his future destiny. This theory confirms the great concept introduced by Maharshi who had pointed out the importance of the moment of rebirth. The same idea was introduced by Varahamihira about 2000 years ago. Through different planetary movements various types of characteristics are often highlighted on human beings. Such influences have an impact on physical reactions, mental attitudes and emotional responses of them. This research will explore about the influences and modern resherches of the Astrology.

**Keywords:** Astrological Influences, Planets, scientists, Modern Reseaches

## හැඳින්වීම

සිද්ධාන්ත, සංහිතා සහ හෝරා යන අංශ තුනෙන් සමන්විත ජ්‍යෝතිෂය මගින් පංචාංගය, ෂඩ් වර්ගය ආදිය උපයෝගී කරගෙන පුද්ගල ජීවිතයේ කාලත්‍රය

පිළිබඳවම කරුණු අවබෝධ කරගත හැකිය. වෛද්‍ය, කාලගුණික, තත්කාලීන ආදි අංශයන් සම්බන්ධයෙන් ද සජීවී වස්තූන්ගෙන් පමණක් නොව අජීවී වස්තූන්ගෙන් වන්නා වූ ප්‍රතිඵල පවා ජ්‍යෝතිෂයට විෂයය වේ. වර්තමානයේ පවා විශේෂයෙන් භාරතීයයන්ගේ මෙන්ම ශ්‍රී ලාංකිකයන්ගේ ජනජීවිතයත් සමඟ ජ්‍යෝතිෂය බද්දව පවතියි. උප්පත්තියේ සිට ජීවිතයේ අවසානය තෙක්ම සැලකිය යුතු සෑම කටයුත්තක්ම ජ්‍යෝතිෂයෙන් තොර නොවේ. උපන් මොහොතට අනුව කේන්ද්‍රයක් සාදයි. දරුවකු දොරට ගෙන ඒමේ සිට සියලුම වැදගත් කටයුතු, නිවැසුමට ගෙයක් පිළියෙල කිරීම, ළිං පොකුණු කැපීම, විහාර දාගැබ් බැඳීම, ආගමික කටයුතු, විවාහ මංගල්‍යය කටයුතු, ගමන් බිමන්, ගොවිතැන් කටයුතු ආදි සෑම අවස්ථාවක දී ම ජ්‍යෝතිෂයේ සහාය අපේක්ෂා කෙරේ.

## ජෝතිෂය යනු

ජ්‍යෝතිෂය කාලය හා සම්බන්ධිත ශාස්ත්‍රයකි. කාලය මැනීම ජ්‍යෝතිෂ ශාස්ත්‍රයෙහි මූලික සිද්ධාන්තයකි. ඒ සඳහා සූර්යයාට සුවිශේෂී වැදගත්කමක් හිමිවනු ලැබේ. කාලය රඳාපවතින්නේ සූර්යයා නිසාය. එහෙයින් වරාහමිහිර හිරු හඳුන්වා ඇත්තේ කලාත්ම හෙවත් කාලයාගේ ආත්මය වශයෙනි. සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථයන්හි සූර්යයා හඳුන්වා තිබෙන්නේ ත්‍රයිතනු හෙවත් ත්‍රී ආත්ම වශයෙනි. මක්නිසාදයත්, ඔහු තිපරිවට්ට හෙවත් උප්පත්ති, ඨිති සහ භංග (ඇතිවීම, පැවතීම සහ නැවතීම) යන භෞතික සංසිද්ධිය මෙහෙයවන්නා වීම නිසයි. හිරු පමණක් නොව සඳුද කාලයේ බෙදීමේ ප්‍රධාන වන බව පෙන්වාදිය හැකිය. මහකවි කාලිදාසයන් ද හිරු සඳු දෙදෙනා යන වදනය වෙනුවට 'යෙ ද්වෙ කාලං විධත්තඃ' (කාලය විධානය කරන දෙදෙනා) යනුවෙන් සඳහන් කරයි. මොවුනගේ කාල විධානය මනුස්සයන් පමණක් නොව ජීවීන් මෙන්ම වෘක්ෂලතා ද හඳුනාගෙන පවතියි. අවුරුදු දින ආදිය බෙදා ගැනීමේ දී චන්ද්‍රයා සහ සූර්යයා වගකීමක් දරන බව ඈත අතීතයේ සිටම හඳුනාගෙන පැවති අතර එය ජ්‍යෝතිශ්ශාස්ත්‍රයෙන් ද සනාථකර වූවකි. අතීතයේ සිටම මනුස්සයා විවිධ සිදුවීම්හි සාපේක්ෂතා මත කාලය කොටස් කරගෙන තිබේ. ඒ සඳහා අනෙකුත් සත්වයන් ද වෘක්ෂලතාවන් යනාදිය උපයෝගී කොටගෙන පවතියි. දවසේ කාලය සෑමවිටම එකිනෙකට වෙනස් බවක් දරයි. උදෑසන, මධ්‍යාහ්නයේ, සැන්දෑවේ සහ මධ්‍යම රාත්‍රියේ කාලගුණය පැහැදිලිවම දැකියහැකි වෙනස්කම්වලින් යුක්තය. සැබැවින්ම ජ්‍යෝතිෂය යනු කාලය හා සම්බන්ධ ශාස්ත්‍රයකි. ජ්‍යෝතිශ්ශාස්ත්‍රයේ පදනමවන කාලය මත පුද්ගයෙකුගේ ත්‍රිදෝෂ තත්වයන් ද වෙනස්වෙයි. මෙම ශාස්ත්‍රයෙහි දැක්වෙන නිවැරදිව කාලය ගණනය කිරීමෙන් සාදාගන්නා වේලාවට අනුව කටයුතු කිරීමෙන් යහපත් සෞඛ්‍යයක් ද ඇතිකර ගැනීමට හැකිවෙයි. පුද්ගලයෙකුගේ උපන් වේලාව මත සකසා ගන්නා ලග්නය, නවාංශකය, නැකත, නැකත් පාදය සහ දශාව ආදිය අන්තර්ගත කේන්ද්‍රය මඟින් ද පුද්ගලයෙකුගේ අතීත, වර්තමාන අනාගත යන කාලත්‍රය සම්බන්ධිත තොරතුරු ප්‍රකාශය කරනු ලැබේ. කේන්ද්‍රයෙහි පළමුවැනි භාවය කිසියම් පුද්ගලයකුගේ ලග්නය වශයෙන් සැලකෙයි. පළමුවැනි භාවය යනු පුද්ගලයකු උපදින වේලාවෙහි නැගෙනහිර දෙසට යොමු වී පැවති භාවයයි. මේතුළින් පෙනීයන්නේ ජ්‍යෝතිෂය

ගැඹුරු හා පුළුල් ශාස්ත්‍රයක් වශයෙනුත් කාලය වූකලී ජ්‍යෝතිශ්ශාසත්‍රයේ දැක්වෙන මූලික අංගයක් වශයෙනුත්ය. අගක් මුලක් දැකිය නොහැකි කාලය අපිරිමිත දෙයකි. බෞද්ධ ඉගැන්වීම්හි ද කාලය සියලු ජීවයන් ඩැහැගනී. (කාලෝ ඝසති භූතානී) යනුවෙන් දැක්වීමෙන් එය තවදුරටත් සනාථ වන්නේයී

## ජ්‍යෝතිෂය විෂයක්ෂේත්‍රය පිළිබඳ නූතන පර්යේෂණ

සාගරයක් බඳු වූ ජ්‍යෝතිෂය අනාදිමත් කාලයක සිට වසර දහස් ගණනක් භාවිත කළේ අඥානකමට ද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය. වර්තමානයේ දී මෙම ශාස්ත්‍රය යම් විටෙක අවඥාවට ලක්වූවක් ලෙස ද පෙනෙයි. ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥ ඕ. ඊ. මාර්ටිනස් මහතා වැන්නන් භාරතීය ජ්‍යෝතිෂය නැතිනම් පෙරදිග ජ්‍යෝතිෂය පැරණි ක්‍රමයෙන් එහාට ගොස් අලුත් යමක් සෙවීමට එහි නියුතු ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥයන් යොමු නොවන බවක් පවසයි. නමුත් පෙරදිග ජ්‍යෝතිෂයේ සිද්ධාන්ත උකහා ගනිමින් අපරදිග විද්‍යාඥයන් නව මංපෙත් කරා යොමුවන බව ද පෙන්වා දෙයි.

මාර්ටිනස් මහතා විසින් මෙම ශාස්ත්‍රයෙහි පරිහානියට හේතුවන කරුණු ගණනාවක්ම ගෙනහැර පායි. ඒ අතර ජ්‍යෝතිෂයේ එන මූලික මූලධර්ම ගැන පවා සැලකිල්ලක් නොදැක්වීම, පඤ්චාඞ්ග ලිත්වල එන අඩුපාඩු සහ වැරදි යනාදිය පෙන්වා දෙයි. එවැනි දෝෂ යම් යම් අය කළ ද කිසිවකුට ජ්‍යෝතිෂය ශාස්ත්‍රය බොරු යැයි ඔප්පු කළ හැකිදැයි සලකා බැලිය යුතුය. එසේ සිතා යමෙකු මෙය ඉගෙනීමට උත්සහ කළහොත් එහි පිහිට සොයන ගැත්තෙකු වන බව ජිනදාස හෙට්ටිගොඩ මහතා සඳහන් කරයි. ඒ කෙසේදයත් "සාගරය කියා එකක් කොයින් ද? එසේ තිබුණත් කියන තරමට පරතෙරක් පෙනෙන තරමට විශාල ද කියා සිටි මෝඩයාට සාගරය පෙනුනාක් මෙනි." පූජ්‍යාචාර්ය ''බට්ලර්''තුමා ජ්‍යෝතිෂය ශාස්ත්‍රය ප්‍රතික්ෂේප කරන අදහසින් එය ඉගෙන ගත්ත ද එහි ගැත්තෙකු වූ බව ''පියර්ස්'' පවසයි.[1]

ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥ කේ. ඇස්. ක්‍රිෂ්ණමූර්ති පඬිවරයා ජ්‍යෝතිෂය ශාස්ත්‍රය පිළිබඳ වාදයක දී අනාවැකි වැරදීමට හේතු Fundemental Principle of Astrology නැමැති ග්‍රන්ථයෙහි පැහැදිලි කර දී තිබේ.[2] සත්‍යය නිවරදිව නොදැන අනාවැකි නැතිනම් ජන්ම පත්‍රයක ප්‍රතිඵල කීමට යෑමෙන් මෙම ශාස්ත්‍රයට සිදුවන හානිය අතිවිශාලය. එම නිසා මෙම වටිනා ශාස්ත්‍රය හෑල්ලුවට පත්වෙයි. එසේ වීම ජ්‍යෝතිෂයේ මිත්‍යාභාවයක් නොව එවැනි දේ කරන අයලුවන්ගේ අල්ප දැනුම නිසාය. මෙම උතුම් ශාස්ත්‍රය පිළිබඳව මනා වැටහීමකින් තොරව කටයුතු කරන නිසා මෙම ගෞරවනීය ශාස්ත්‍රය පරිහානියට පත්ව ඇත. නමුත් මෙම ශාස්ත්‍රයෙන් ප්‍රයෝජන ගන්නෝ බොහෝ වෙති. එහෙත් ශාස්ත්‍රයෙහි අවසානයක් නොමැත.[3]

ජ්‍යෝතිෂය සම්බන්ධයෙන් වර්තමාන ලෝකය තුළ ද විවිධ පර්යේෂණ සිදු කෙරේ. මෙම ශාස්ත්‍රයෙහි රවි, සඳු ආදි ග්‍රහයන් මිනිසුනට බලපා ඔවුනගේ දෛවය තීරණය කෙරෙන බවක් පෙන්වා දෙයි. රවි ග්‍රහයා හෘදයාබාධවලට අධිපති වශයෙන්

කටයුතු කෙරෙන බව ජ්‍යොතිෂයේ පිළිගැනීම වේ. එය ඒ ආකාරයෙන් බලපාන බව විද්‍යාඥයන් විසින් පෙන්වා දී තිබේ. සෝවියට් වෛද්‍ය විද්‍යාඥයකු වන මහාචාර්ය විචෙව්ස්කි හිරු සහ වසංගත රෝග අතරෙහි සබඳතාව සනාථ කර පෙන්වා දෙන අතර රිය අනතුරු, මානසික රෝගවලට ද හිරුගේ බලපෑමට ලක්වෙන බව සඳහන් කරයි.[4]

සිතකින් සිතකට පණිවුඩ යැවීමේ හැකියාව ද එකී පණිවුඩයේ ලැබීමේ හැකියාවේ ද ප්‍රබලත්වය හෝ දුර්වලත්වය රඳා පවතින්නේ සූර්යයා මත බව රුසියානු විද්‍යාඥ එඩ්වඩ් නම්මෝව් සඳහන් කරයි.[5]

ආචාර්ය ලෙනාඩ් රවිට්ස්, ආචාර්ය වී ඉන්යුෂින් මෙන්ම තවත් විද්‍යාඥයන්ගේ පර්යේෂණ තුලින් සූර්යාගේ ආලෝකය හැර වෙනත් චුම්බක ශක්තීන් ද විද්‍යුත් චුම්භක ශක්තීන් ද සෝලා ප්‍රෝටෝන් ධාරා ද නියුට්‍රෝන ද රේඩියො තරංග ඇතුළු නොයෙකුත් ශක්තීන් ද පොළවට පැමිණෙන බවත් ඒවා පොළොවේ චුම්භක ශක්ති, ප්ලැස්මා ශක්ති පද්ධතිය කෙරෙහි බලපා අපගේ බයෝ ප්ලාස්මීය පද්ධතිය හරහා අපටත් බලපෑම් කරන බව පෙන්වා දෙයි.[6] ප්‍රංශයෙහි ෆ්ලෝරන්ස් සරසවියෙහි ආචාර්ය ජෝජියෝ පිකාඩ් හිරුගේ ශක්තීන් රසායනික ප්‍රතික්‍රියාවනට පවා බලපාන අතර එම බලපෑම් පොළොවේ විවිධ ස්ථානවල දී වෙනස් වන බවත් පෙන්වා දී තිබේ.[7] මෙහි බලපෑමට විශ්වයේ ජලය මෙන්ම සිරුරෙහි ඇති ජලය කෙරෙහි ද නිතැතින්ම ලක්වන බව ස්කොට් හිල් සහ ජී. එල්. ප්ලේෆෙයා පෙන්වා දී තිබේ.[8] ජපන් ජාතික වෛද්‍ය මකී ටකාටා[9] හිරු උදාව, බැස යාම, ග්‍රහණ මෙන්ම හිරු ලප ඇති අවස්ථාවල යන සූර්යාගේ වෙනස්කම් වූ විට ලේවල කැටි ගැසීමේ වෙනස්කම් ක්ෂණිකවත් ප්‍රබලබවත් පෙන්වා දෙන අතර මනුෂ්‍යයා යනුවෙන් ඔහු පවසන්නේ ජීවයෙන් යුතු සූර්ය ඝටිකාවකැයි යනුවෙනි.

භාරතයේ ද ශ්‍රී ලංකාවේ ද නොයෙකුත් ශාස්ත්‍ර ක්‍රම සඳහා ප්‍රබල වශයෙන් සූර්යාගේ බලය යොදාගෙන ඇත. ඒ අතර ඉන්ද්‍ර ගුරුළුව, යමකාලය, පඤ්ච පක්ෂිය ආදිය දැක්විය හැකිය. විශේෂයෙන් හින්දූන්ගේ වැඳුම් පිදුම් අතර සූර්ය නමස්කාරය ප්‍රධාන ගණයෙහිලා සැලකිය හැකි වේ.

ඊජිප්තු දෙවස්ථානත් සෙන්ට් ජෝන් ලැටරන්, සෙන්ට් පීටර්ස් යනාදි විශාල රෝම පල්ලිවලත් ප්‍රධාන දොරටුව නැගෙනහිරට වූ අතර එය සූර්ය වන්දනාව මඟින් ඇති වූවකැයි එල්වර්ති කියයි.[10] කොමැන්චේ රතු ඉන්දියන්වරුන්[11] සූර්ය වන්දනාව කළ අතර ඔවුන් යුද්ධයට යන විට ආයුධවලට හිරු නැගෙන විට කිරණ වැදීමට ස්වකීය නවාතැනේ නැගෙනහිරින් එම ආයුධ තැබූ බව ද නිව්මෙක්සිකෝහි පුවේබ්ලෝ ඉන්දියන්වරුන්[12] සූර්යයා නැගෙන අවස්ථාවෙහි එයට මුහුණලා වන්දනා කළ බව ද පෙනෙයි. එසේම ලුසියානාහි නචීගෝ නායකයා ස්වකීය ගෘහයෙහි දොරකඩ සිට නැගෙනහිරට ආචාරකර පසුව අනෙකුත් දිසාවලට ද අචාර කර ඇත.[13] පේරු රටේ නැගෙනහිර කඳු බෑවුම්හි නිවාස සකසා තිබෙන්නේ ද සූර්යයා නැගී එන අවස්ථාවෙහි ආචාර කිරීම සඳහාය.[14] බෙඩුවින් අරාබිවරු ද නැගෙනහිරුට ආචාර කළ බව පොඩ්ග්‍රෙච් ගෙනහැර පායි.[15]

ප්‍රංශ ජාතික විද්‍යාඥයකු වූ මයිකල් ගැකොලින් ග්‍රහයන් මිනිසුන්ට බලපාන අන්දම පිළිබඳව පරීක්ෂණ කළ ප්‍රකට විද්වතෙකි. ඔහු උපන් වේලාවල් විසිහත් දහසක් පරීයේෂණයට ලක් කොට පැවසුයේ දරුවකු උපදින වේලාවත්, ඔහුගේ අනාගත රැකියාවත් අතර සබඳතාවක් පවතින බවය. තවද ඔහු මව්පිය දෙදෙනාගෙන් එක් අයෙකුගේ නැතිනම් දෙදෙනාගේම ග්‍රහ පිහිටීම්වලට සමාන ග්‍රහ පිහිටීමක් දරුවන් උපන් අවස්ථාවෙහි ග්‍රහ පිහිටීමට සමාන බවක් දැකිය හැකි බව ඔහු පවසයි.[16] එසේම උපන් දින තිස්දහසක් පමණ පරීක්ෂා කර බලා මතු රැකියාවක් අතර සබඳතාවක් පවතින බවත් උපන් අවස්ථා, සෘතු නැතිනම් කාල සීමාවල් අතර ද සබැඳියාවක් පවතින බව බ්‍රිතාන්‍යය සමාජවිද්‍යාඥ ජෝ කුපර් මෙන්ම බිරුඩ්ෆෝඩ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඇලන් ස්මිදර්ස් පෙන්වා දෙයි.[17] බ්‍රිතාන්‍යය මනෝවිද්‍යාඥ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය හැන්ස් ජේ. අයිසෙන්ක් සහ බ්‍රිතාන්‍යය ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥයෙකු වූ ජෙෆ් මායෝ යන දෙපලගේ පරීක්ෂණවලට අනුව පුද්ගලිකත්වය හෙවත් චරිත ලක්ෂණ සඳහා ජ්‍යෝතිෂයේ එන ස්ත්‍රී පුරුෂ යන රාශි ලක්ෂණවලට අනුකූලව ඇතිවන බව සත්‍ය වශයෙන්ම ඔප්පු වන බවක් පවසයි.[18] එසේම යේල් සරසවියේ ආචාර්ය ලේනාඩ් රෙවිට්ස් ද චන්ද්‍රයාගෙන්, රවිගෙන් ආදි ග්‍රහයන්ගෙන් විශ්වයට පැමිණෙන විවිධ කිරණ තරංගයන් පොළොවේ චුම්භක ක්ෂේත්‍රයට බලපෑම් කරණ බවත් එය මිනිසුන්ට ද බලපෑම් කරන බවත් සඳහන් කරයි.[19]

සඳු ග්‍රහයාට සුවිශේෂ තැනක් ජ්‍යෝතිෂය ශාස්ත්‍රයෙහි දී හිමි වේ. සඳු සිතට අධිපති වන අතර ජලයට අධිපතිත්වය දරයි. ආචාර්ය ලෙනාඩ් රෙවිට්ස් පෙන්වා දෙන්නේ පුර පසළොස්වක දිනයේ හෝ අමාවක දිනයෙහි දී මිනිස් සිරුරේ විද්‍යුත් වෝල්ටීයතාවය වැඩිවන බවක්ය.[20] වෛද්‍ය එඩිසන් ඇන්ඩෲස් ද පුරපෑළවිය පටන් පුර පසළොස්වක තෙක් වූ දින 15 ක් තුළ ලේ ගැලීමෙන් වන හානි අධික වන බවත් පවසයි.[21] ඒ. එල්. ලීබර් සහ සී. ආර්. ෂෙරීන් යන පරියේෂකයන් වසර 15 ක පමණ මිනීමැරුම් ඇමෙරිකාවේ ෆ්ලෝර්ඩාහි ඩේඩ් ප්‍රාන්තයේ ද වසර 13 ක් ඇතුළත ඔහියෝහි ක්ලීව්ලන්ඩ් නගරයත් ඇතුළත වූ මිනී මැරුම් ද පරීක්ෂණයට ලක්කර ඒවා බොහෝ විට සිදු වූයේ පසළොස්වක දිනයක වන අතර හෝ වැඩිපුරම ඒවා සිදු වූයේ මාසේ පෝය ගෙවුණ ගමන්ම බව පවසයි.[22]

ආචාර්ය එල්. කේ. කොලිස්කෝ තිරුඟුවලින් වඩා අස්වැන්න ලැබීමට සඳු නැඟෙන කාලයෙහි සිටුවිය යුතු බව වසර නවයක පර්යේෂණ තුළින් පෙන්වා දී තිබේ. තවද ඇය ප්‍රකාශ කරුණු ලබන්නේ බඩඉරිඟු පුර පසළොස්වක පෝයදාට දින දෙකකට ප්‍රථමයෙන් සිටුවීම තුළින් අස්වැන්න වැඩිවෙන බවක්ය.[23]

## සමාලෝචනය

සිද්ධාන්ත, සංහිතා සහ හෝරා යන අංශ තුනෙන් සමන්විත ජ්‍යෝතිෂය ගැඹුරු හා පුළුල් ශාස්ත්‍රයක් වශයෙනුත් කාලය වූකලී ජ්‍යෝතිශ්ශාසත්‍රයේ දැක්වෙන මූලික අංගයක් වශයෙනුත්ය. එසේම ජ්‍යෝතිෂය සම්බන්ධයෙන් වර්තමාන ලෝකය

තුළ ද විවිධ පර්යේෂණ සිදු කෙරේ. ඒ අනුව මෙම ශාස්ත්‍රයෙහි දැක්වෙන රවි, සඳු ආදි ග්‍රහයන් මිනිසුනට බලපා ඔවුනගේ දෛවය තීරණය කෙරෙන බවත් එය විවිධාකාරයෙන් පුද්ගල ජීවිතයට බලපාන බවත් විද්‍යාඥයන් විසින් පෙන්වා දී තිබේ.

## ආන්තික සටහන්

1. බට්ලර්තුමාගේම වචනය, ''මගේ මෝඩකමිනුත් අහංකාර අධර්මිෂ්ටකමිනුත් මගෙන් අපහාස ලත් ඒ පූර්වාචාරීන් කෙරෙහි මගේ ශීඝ්‍ර ප්‍රණාමය ජ්‍යොතිශ්ශාස්ත්‍රය ඉගෙනීම නිසා ඇතිවිය.''හෙන්ද්‍රික් ද සිල්වා හෙට්ටිගොඩ, *ජීවිතය හා ග්‍රහයෝ*, රත්මලානඃ තුසිත පොත්හල, 1996, පි. 3.
2. ''මා උගත් මිත්‍රය, උණ සන්නිපාතය වැළඳුණු බව හරියටම හඳුනාගත් වෛද්‍යවරයා තමා උගත් විද්‍යාව අනුව බෙහෙත් කරයි. රෝගීන්ගෙන් දෙදෙනකු මියගොස් තුන්වැන්නා බරපතල වෙයි. සෙස්සන් සුවපත් වෙයි. එකම රෝගයට, එකම වෛද්‍යවරයා එකම බෙහෙත් දී දෙදෙනෙකු මිය යන්නටත්, එක් අයෙකු අසාධ්‍ය වන්නටත් සෙස්සන් සුව වන්නටත් හේතුව කුමක්ද? ඔබ ඒ ගැන මොකද කියන්නේ? ප්‍රශ්න විචාරකයාට ඒ ගැන යමක් කීමට නොහැකි විය. ඔහුට සිදුවූයේ ප්‍රකට ජ්‍යොතිර් විද්‍යාඥයාගේ පිළිතුරට අවනත වීමටය.''
3. පිටි පතුල නොතමෙන තරමට දියට බැස සිප්පි කටු අවුලමින් සාගරයෙන් ප්‍රයෝජන ගන්නා පොඩි දරුවන් මෙන්ම මුහුදු තරණය කොට රටවල් සොයා යන මහා නාවිකයෝ ද සාගර පතුල සොයන රසායනඥයෝ ද සාගරයෙන් ප්‍රයෝජන ගනිති. කිසි කලක සාගරය නුදුටු එය කුමක් ද කියා නොදන්නාවුන්ගෙන් පිහිට පිණිස ඒ ලබාගත් දේ පවතියි.
4. ඒ. එම්. ආර්. බෝපෙගෙදර, *විද්‍යාවෙන් ඔපවෙන අපගේ විශ්වාස හා ඇදහිලි*, නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ, 2004, පි. 131.
5. එම.
6. එම, පිටු. 130.
7. එම.
8. එම, පිටු. 130 -131.
9. බෝපෙගෙදර, එම, 2004, පි. 130-131.
10. එම, පි. 127.

11.0 එම.

12. එම, පි. 128.
13. එම.
14. එම.
15. එම.
16. එම, පි. 138.
17. එම.
18. එම.
19. එම.
20. එම, පි. 139.
21. එම, පි. 140.
22. එම.
23. එම.